**වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**----------------------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
----------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ආරම්භක ශේෂයේ ඇතුළත් වත්කම් භෞතිකව නොතිබුණද, වර්ෂය අවසානයට වත්කම්වල වටිනාකමෙහි එම ශේෂ ඇතුළත්ව තිබුණු හෙයින් 2016 දෙසැම්බර් 31 දිනට වත්කම් වටිනාකම රු.9,772,052 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.2,655,937 ක් වුවද රජයේ ණයගැති ගිණුමේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.2,554,280 ක් ලෙස දක්වා තිබුණු හෙයින්, විගණනයේදී රු.101,657 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.2 ලැබිය යුතු ගිණුම්**
**----------------------**

ලැබිය යුතුව ඇති රු.43,700 ක ආයුර්වේද පරිත්‍යාග ලබා ගැනීම් සඳහා වර්ෂ 13 කට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**
**------------------------------------------------**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා රීති සංග්‍රහය (මූල්‍ය හා පරිපාලන) | |
| (i) රීති 153 | ලැබිය යුතු ආදායම් ප්‍රකාශනය (P.S.7) පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) රීති 165 | ප්‍රධාන ලෙජරයේ බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳව සටහන් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | එකතුව රු.44,928 ක් වූ ඉකුත් තැන්පතු, තැන්පතු ගිණුමේ දිගු කාලයක් පැවතියද, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.1 ඡේදය | මාස 06 කට වතාවක් ඉන්ධන ටැංකිය සම්පූර්ණයෙන් පුරවා ධාවනයේ යොදවා ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂා කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.2,319,247 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.7,950,470 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,631,223 ක පිරිහීමක් දැක්වුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි සකස් කර නොතිබූ හෙයින් හා ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කර වැඩසටහන් ගතකර නොතිබූ හෙයින් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.2.2 දේපල සඳහා වරිපනම් බදු

සභාව යටතේ පවතින දේපල සඳහා පසුගිය වර්ෂ 10 කට වැඩි කාලයක සිට ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණු අතර ඒ සඳහා වරිපනම් බදු ද අයකර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ මුදල්

2016 දෙසැම්බර් 31 දිනට වවුනියා අධිකරණයෙන් විවිධ ආඥාපනත් යටතේ අයවිය යුතුව ඇති රු.1,088,770 ක උසාවි දඩ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

සභාවට ලැබිය යුතු රු.2,554,280 ක මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ මෝටර් වාහන 6 ක් දිගු කාලයක සිට නිෂ්කාර්යව පැවතියද, 2015 ජුලි 10 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක 02/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාවේ මෝටර් වාහන 18 ක් පැවතියද එම වාහනවල අයිතිය සභාවට පවරා ගැනීම සඳහා මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ලෙස විෂයයන් 210 ක් දක්වා තිබුණද, 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දිනය දක්වා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළ උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) යටතේ රු.7,008,023 පිරිවැයකට සාප්පු සංකීර්ණයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, සාප්පු සංකීර්ණයේ තලාද (Beam) මට්ටමේ පිපිරීම් 3 ක් හා සෑම කඩ සාප්පුවකම සිරස් අතට පිපිරීම් විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. ඊට අමතරව, ඉදිරිපස ශාලාවේ තිරස් අතට පිපිරීම් 03 ක් දිස් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පෙරියතම්පනායි පොදු ළිඳ ඉදිකිරීමේ වැඩ සඳහා සභාව විසින් රු.331,547 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳ සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවේදී පිපිරීම් 06 ක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මරුක්කරම්පලායි පොදු ළිඳ ඉදිකිරීමේ වැඩ සඳහා සභාව විසින් රු.390,469 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, එහි පිපිරීම් 07 ක් නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රමාණලන්කුලම් පොදු ළිඳෙහි ඉදිකිරීම් වැඩ 2016 නොවැම්බර් 14 දින නිම කර තිබූ අතර ඒ සඳහා රු.334,434 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, එය 2017 ජූනි 22 වන විටත් උපයෝජනය කර නොතිබුණි.

## 2.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

### (අ) තුඩ්ඩුවාකයි වෙළඳපොල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කාර්යයන්

--------------------------------------------------------------------

තුඩ්ඩුවාකයි වෙළඳපොල ගොඩනැගිල්ලේ වැඩ 2016 දෙසැම්බර් 28 දින නිම කර තිබූ අතර සභාව විසින් රු.297,262 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. කෙසේ වුවද, 2017 ජූනි 22 දක්වා එය උපයෝජනය කිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

**(ආ) වෙඩ්ඩිකුලම් (තුඩරිකුලම්) මහජන පුස්තකාලයේ අලුත්වැඩියා කාර්යයන්**

**--------------------------------------------------------------------------------**

මහජන පුස්තකාලයේ අලුත්වැඩියා කාර්යයන් 2016 දෙසැම්බර් 28 දින නිම කර තිබූ අතර සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.496,011 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, සභාව විසින් 2017 ජුලි 22 දක්වාත් එය උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.6 සේවක හිඟය - 2016**

**------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 62 ක් හා 47 ක් විය. එබැවින් සේවක ඌනතාවය 15 ක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

**3. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(i) ආදායම් රැස් කිරීම්
(ii) ස්ථාවර වත්කම්
(iii) අත්තිකාරම් ලැබීම්
(iv) අත්තිකාරම් ගෙවීම්
(v) ප්‍රාග්ධන වැඩ
(vi) ප්‍රධාන ලෙජරය පවත්වා ගැනීම